**2026.06.09 දින පෙ.ව. 09.30 ට බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2026 ජුනි මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.**

සහභාගීත්වය :-

| | | | |
|---|---|---|---|
| 1. | ඩී. ප්‍රේමකුමාර ලසන්ත විජේවර්ධන මැතිතුමා | - | ගරු සභාපති |
| 2. | ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා | - | ගරු උප සභාපති |
| 3. | කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 4. | පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 5. | ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 6. | ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 7. | ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 8. | උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 9. | ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 10. | එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. | එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. | සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. | ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. | කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. | ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 16. | නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 17. | ලියනගමගේ අභයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. | එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 19. | යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය | - | ගරු මන්ත්‍රිනී |
| 20. | ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 21. | බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 22. | ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

සහභාගී නොවූ :-

| | | | |
|---|---|---|---|
| 1. | මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 9.30 ට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ගරු උප සභාපති ඩබ්. ඩී. ප්‍රසන්න ප්‍රදීප් කුමාර ගුණවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. ඩී. මිගාර නේමින්ද වලල්ලාවිට මැතිතුමා, ගරු මන්ත්‍රිනී පී. ලෙනිකා දූෂන්ති මැතිතුමිය, ගරු මන්ත්‍රී ඩී. එම්. සී. තාරක විජේකෝන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා, ගරු මන්ත්‍රී ආඩිගේ රංජිත් අමරසිරි ප්‍රනාන්දු මැතිතුමා, ගරු මන්ත්‍රී උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී. ඩී. නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී එම්. ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා, ගරු මන්ත්‍රී සමිත ලක්මාල් පුංචිහේවා මැතිතුමා, ගරු මන්ත්‍රී කේ. කේ. පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා,

ගරු මන්ත්‍රී ලියනගමගේ විජිත් සම්පත් මැතිතුමා, ගරු මන්ත්‍රී නිහාල් ගාමිණී මැදගොඩ මැතිතුමා, ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න මැතිතුමා, ගරු මන්ත්‍රී එච්. තිලක් උපුල් චමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රිනී යූ. කේ. මධුභාෂිකා දිල්හානි මැතිතුමිය හා ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා යන මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් යුතුව සභාවේ කටයුතු ආරම්භ විය.

**ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.**

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් පුරා වසරක කාලයක් සභා කටයුතු වෙනුවෙන් සහයෝගය දැක්වීම පිළිබඳ සියලු දෙනාට තම ස්තූතිය පළ කරමින් අද දින පවත්වනු ලබන 12 වන සැසි වාරය සඳහා ගරු උප සභාපතිතුමා ඇතුළු සියලු සභිකවරුන් ද, ප්‍රාදේශීය සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ද, මාධ්‍යවේදී මහත්වරුන් ද සාදරයෙන් පිළිගන්නා ලදී.

**1. පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම :-**

1.1. 2026.05.12 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.

**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**

2026.05.12 දින පැවති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සභිකයින් වෙත මේ වන විට යොමු කර ඇති බවත්, එහි සංශෝධන තිබේ නම් ඒවාට යටත්ව වාර්තාව කියවූවා සේ සලකා සභාව මඟින් සම්මත කිරීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

**සංශෝධන අංක 01 - ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන**

පසුගිය සභා වාරයේ කල් නොදුන් යෝජනා යටතේ ඉදිරිපත් කළ 5.11.5 යෝජනාවේ තක්සේරු කටයුතු සඳහා යොදා ගන්නා කම්කරුවන්ගේ වැටුප් පිළිබඳ නිශ්චිතව දක්වා නොමැති බැවින් එම යෝජනාවේ අවසාන වැකිය "එබැවින් තක්සේරු ප්‍රතිශෝධන කාර්යයට පමණක් අදාළ වන ලෙස සහ එම කටයුතු නිම වූ පසු සේවය අවසන් කිරීමට යටත්ව එනම් තත්ත්කාර්යය පදනම මත කම්කරුවන් 10 දෙනෙකු, එක් අයෙකුගේ වැටුප 2026.01.01 දිනට PL තනතුර දරන දෛනික කම්කරුවෙකුගේ වැටුප් හා දීමනා ඇතුළත් දිනක වැටුප වන රු. 1,888.76 ක් වන ලෙස සහා අරමුදලින් ගෙවීමට යටත්ව සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි." ලෙස සංශෝධනය විය යුතුයි.

**සංශෝධන අංක 02 - ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධන**

පසුගිය සභා වාරයේ 5.9.5 යටතේ ඉදිරිපත් කළ "දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත මීටර් 30 ක් පමණ තාර දමා අලුත්වැඩියා කිරීම" යෝජනාව "දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත මීටර් 30 ක් පමණ තාර හෝ කොන්ක්‍රීට් දමා අලුත්වැඩියා කිරීම" ලෙස සංශෝධනය විය යුතුයි.

ඉහත සංශෝධනයන්ට යටත්ව 2026.05.12 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව, ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන විශේෂ නිවේදන :-**

2.1. අංක SPLG/GL/B/BENPS/05/25/08 හා 2026.05.27 දිනැති ලිපිය මඟින් 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය සමාලෝචනය, මෙහෙයුම් සමාලෝචනය, ගිණුම් කටයුතුභාවය හා යහපාලනය සම්බන්ධව විගණකාධිපතිවරයා විසින් එවා තිබූ විගණන වාර්තාව ප්‍රාදේශීය සභාව වෙත ලැබී ඇති බව සහ එය සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලදී.

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන ගරු සභාවට ඉදිරිපත් කිරීම :-** කිසිවක් නැත

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :-** කිසිවක් නැත

**5. යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**5.1.** <u>**ගරු මන්ත්‍රී, නිශාන්ත කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

- ගරු මන්ත්‍රී නිශාන්ත කුමාර මැතිතුමා මෙම සභා වාරය සඳහා නොපැමිණීම හේතුවෙන් මෙම යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

5.1.1. බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් හා වරියන් විසින් 2025 වර්ෂයේ සහ 2026 වර්ෂයේ අප්‍රේල් මස දක්වා ප්‍රතිසංස්කරණය සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති මෙන්ම මෙතෙක් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ නොකරන ලද බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති සියලුම පාරවල් අබලන් වීමේ ප්‍රවණතාවයේ වැඩි තත්ත්වයේ සිට අඩු තත්ත්වය දක්වා ප්‍රමුඛතා ලේඛනයක් සකස් විය යුතු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

මෙය ඉතාමත්ම හොඳ යෝජනාවක් වන බවත්, මේ සඳහා අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමා කරුණු වෙන් කොට දක්වමින් සවිස්තරාත්මකව මෙම යෝජනාව ඉදිරිපත් කර තිබූ බවත්, එහි සාරාංශය යෝජනාවක් ලෙස මෙලෙස න්‍යාය පත්‍රයට ඇතුළත් කළ බවත්, ප්‍රමුඛතා ලේඛනයක් මඟින් වැඩි අවශ්‍යතාවය සලකා මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවට එතුමන් විසින් යෝජනා කර ඇති බවත්, එක් කොට්ඨාසයක අබලන්ව පවතින මාර්ගයකට වඩා තවත් කොට්ඨාසයක අබලන් මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය වැඩි වීමේ හැකියාවක් පවතින බවත්, මේ නිසා ප්‍රමුඛතා ලේඛනයක් සකස් කිරීම තරමක් අපහසු වනවා සේම මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනු ලබන යෝජනා ඉටු කිරීම සභාවේ පවතින මුදල් තත්ත්වය මත තරමක් සීමා වන බවත්, නමුත් මේ පිළිබඳ සලකා බැලීමට කටයුතු කරන බවත් මෙහි දී සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.2.** <u>**ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.2.1. මීටර් 150 ක් පමණ වන අතුරුවැල්ල බුද්ධගොඩවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.45 ට ගරු මන්ත්‍රී ඩබ්. ඩී. රුසිත නන්දන තුෂාර මැතිතුමා හා ගරු මන්ත්‍රී ඩී. නිස්සංක කුමාර දේශප්‍රිය මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

**5.3.** <u>**ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.3.1. හිපන්වත්ත ප්‍රධාන මංසන්ධියේ කලින් තිබූ බෝක්කුව නැවත ප්‍රතිස්ථාපනය කොට මංසන්ධියේ සිට ප්‍රදීප් මහතාගේ කඩය දක්වා කාණු පද්ධතිය වතුර බැස යන ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා**</u>

හිපන්වත්ත ප්‍රධාන මංසන්ධියේ පෙර දී බෝක්කුවක් තිබූ බවත්, මාර්ගය සංවර්ධනය කිරීමේ දී කුමන හෝ හේතුවක් මත එම බෝක්කුව ඉවත් කර ඇති බවත්, මහජන පැමිණිල්ලකට අනුව ඔබතුමත් එම ස්ථානය නිරීක්ෂණය කිරීමට ගොස් ඇති බවට තොරතුරු ලැබුණු බවත්, බෝක්කුව නොමැති බැවින් මේ වන විට එම ස්ථානයේ ගැටලු රාශියක් මතුවී තිබෙන බවත්, වැසි ජලය ගලා යාමට ස්ථානයක් නොමැති බැවින් අවට ඉඩම්වලට මෙම ජලය ගලා යන බවත්, මේ හේතුවෙන් එම ඉඩම් අයිතිකරුවන් අතර ද ආරවුල් හටගෙන ඇති බවත්, නැවත එම බෝක්කුව ප්‍රතිස්ථාපනය කර දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>

දිගින් දිගටම එම ප්‍රදේශයේ අයෙකු එම බෝක්කුව පිළිබඳ සභාවට මෙන්ම අගමැතිතුමියට, ජනාධිපතිතුමාට ආදී සෑම අයෙකුටම ඉතා දිගු ලෙස විස්තර දක්වා ලිපි යවා තිබූ බවත්, ඒ අනුව ලේකම්තුමා හා තාක්ෂණ සේවා නිලධාරීතුමා සමඟ එහි ස්ථානීය පරීක්ෂාවක් සඳහා එම ස්ථානයට ගිය බවත්, පැමිණිලි පාර්ශ්වය එදින නොසිටි බවත්, නමුත් පැයකට ආසන්න කාලයක් අවට නිවැසියන් සමඟ සාකච්ඡා කළ බවත්, පැමිණිලිකරු විසින් දක්වා තිබූ ආකාරයට එම ස්ථානයේ ගැටලුව නොවිසඳෙන බවත්, මේ පිළිබඳ වැඩිදුර තොරතුරු, තාක්ෂණ සේවා නිලධාරීතුමන් මඟින් දැනගැනීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 09.50 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>**කාරක සභා අවස්ථාව**</u>

<u>**තාක්ෂණ සේවා නිලධාරී, එම්. ඒ. එස්. ජයසිංහ මහතා**</u>

එම ස්ථානය තුන්මං හන්දියක් බවත්, එක් පැත්තකින් මාර්ගය උස්ව පවතින බවත්, බෝක්කුව තිබූ ස්ථානයෙන් බෝක්කුව හරහා නොව ඉන් දෙපසට ජලය ගලා ගිය බවත්, එම ස්ථානයෙන් පහළට ඉඩම් දෙකක් අතරින් කාණුවක් පවතින බවත්, එම කාණුව ඇල්පිටිය දෙසට දිගටම සුද්ධ කොට ඊට පහළින් ඇති කාණුවට සම්බන්ධ කළ විට ඒ හරහා ජලය ගලා යාමට හැකිවන බවත්, එය එම ස්ථානයට සාර්ථක විසඳුමක් වන බවත්, එම ස්ථානයේ උස් බව හේතුවෙන් බෝක්කුවක් යෙදූව ද ඒ හරහා ජලය ගලා යාමක් සිදු නොවන බවත්, බෝක්කුවෙන් දෙපසට පමණක් ජලය ගලා යන බවත්, මීට වසර 15 කට පමණ පෙර අයි රෝඩ් නැමති ව්‍යාපෘතියකින් මාර්ග සංවර්ධන අධිකාරිය මෙම මාර්ගය කාපට් කර ඇති බවත්, එම අවස්ථාවේ අවශ්‍යතාවයක් නොමැති නිසා එම බෝක්කුව ඉවත් කර ඇති බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>

මාර්ගය සංවර්ධනයට පෙර නිවැරදි ආකාරයට තිබූ බවත්, මේ වන විට මාර්ගය උස් වී ඇති බැවින් බෝක්කුව නැවත එම ස්ථානයේ සවි කළ ද ඒ හරහා ජලය නොබසින බවත්, බොක්කුව යෙදූවොත් නැවත කාණුවක් කැපීමට සිදුවන බවත්, එම මාර්ගයේ වාහනයක් හරවා ගැනීමට තිබෙන එකම ස්ථානය එම තුන්මං හන්දිය වන නිසා එය සිදු කළ නොහැකි බවත්, බෝක්කුවක් යෙදූවොත් කාණුව කොන්ක්‍රීට් කිරීමට සිදුවන බවත්, එමෙන්ම බෝක්කුව හා කාණුව නැවත ඉල්ලන පාර්ශ්වය තමාගේ ඉඩමේ මායිමෙන් ඇති කාණුව අවහිර කර ඇති බවත්, එම කාණුව නඩත්තු කර පවත්වාගෙන යන්නේ නම් ජලය බැස යාමේ ගැටලුවක් නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා**</u>

අවට නිවැසියන් මේ හේතුවෙන් දැඩි ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දී සිටින බැවින් එම කාණුව පිරිසිදු කර හෝ කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන ලෙස සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 09.55 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>**මහ සභාව**</u>

<u>**ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා**</u>

අතීතයේ සිටම එම බෝක්කුව හරහා ජලය ගලා නොගිය බවත්, පැමිණිලි පාර්ශ්වය හා නිහාල් යන අයගේ නිවාස 02 අතරින් එම ජලය ගලා ගිය බවත්, සමන්ත කියන පුද්ගලයා එම කාණුව අල්ලා තාප්පයක් බැන්ද බවත්, මේ හේතුවෙන් සමන්තගේ ඉඩමේ එම ජලය එකතු වී තිබෙන බවත්, පහත් ස්ථානයෙන් ජලය ගලා

යා යුතු බැවින් නැවත පෙර ස්ථානයෙන්ම ජලය ගලා යාමට හැකිවන ලෙස සකස් කළ යුතු වන බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>
තාක්ෂණ සේවා නිලධාරී මඟින් කම්කරුවන් යොදවා කාණුව සුද්ධ කර දීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- මෙම අවස්ථාවේ දී පෙ.ව. 9.57 ට ගරු මන්ත්‍රී බී. සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා ගරු සභාවට පැමිණෙන ලදී.

5.3.2. හිපන්වත්ත ක්‍රීඩාංගනයේ ඉදිකර ඇති බැම්ම වටා ආරක්ෂිත දැලක් ඉදි  කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, විජිත් සම්පත් මැතිතුමා**</u>
හිපන්වත්ත ක්‍රීඩාංගණය වටා කළු ගල් බැම්මක් ඉදි කර තිබෙන බවත්, නමුත් අඩි 10 ක පමණ පල්ලමක් තිබෙන බැවින් ක්‍රීඩා උත්සවයක් හෝ අවුරුදු උත්සවයක් වැනි දෑ පවත්වන විට දී අනාරක්ෂිත තත්ත්වයක් පවතින බවත්, එම ස්ථානයේ උපරිම උස මීටර් 150 ක් පමණ වන බවත්, ආරක්ෂිත දැලක් ඉදි කර දෙන ලෙස ඉල්ලීමක් සිදු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.4.** <u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.4.1. විමධ්‍යගත අයවැය වැඩසටහන 2026 - බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, සංවර්ධන ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබා ගැනීම යටතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් සංවර්ධනය කිරීම සඳහා යෝජනා කර ඇති අප සභාවට අයත් පහත මාර්ගයන් සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘති යෝජනාව හා වෙන්කළ මුදල (රු.) | ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රී | වසම භාර ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරී |
|---|---|---|---|---|
| 01 | 2 ඒ වරාහේන | වරාහේන වසමේ සූරියගොඩ තම්බියාවත්ත අංක 02, පොදු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම (රු. 800,000.00) | හසාරා ලියනගේ මැතිනිය | කේ. ඩී. චතුරිකා සංජීවනී මිය |
| 02 | 10 ඒ වරකමුල්ල | කන්දෙවත්ත මාර්ගයේ අබලන් වූ කොටස් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම (රු. 900,000.00) | නිශාන්ත පෙරේරා මැතිතුමා | දිලේෂා ගුණසේකර මිය |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.4.2. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2026 - බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, සංවර්ධන ව්‍යාපෘති සඳහා එකඟතාවය ලබා ගැනීම යටතේ සංවර්ධනය කිරීම සඳහා හඳුනාගත් අප සභාවට අයත් පහත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යොජනා කර සිටිමි.

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ව්‍යාපෘති යෝජනාව හා වෙන්කළ මුදල (රු.) | වසම භාර ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරී |
|---|---|---|---|
| 01 | 13 රන්තොටුවිල | කෝට්ටයාගොඩ ගුරුහේන්ගොඩ මාර්ගය සංවර්ධනය කිරීම (රු. 1,000,000.00) | පී. ඒ. දිලූක මෙන්ඩිස් මයා |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.5. <u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.5.1. බෙන්තොට හුංගන්තොට දැනට තොටවත්ත පාර නමින් භාවිත වන ප්‍රාදේශීය සභාව සතු හරස් පාර ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත රණවිරු මාවත නමින් නම් කිරීමට හා නාම පුවරුවක් ගැසීමට සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>

මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක් නොවන බවත්, පසුගිය දිනක රණවිරු සැමරුමක් එම ස්ථානයේ පැවැත්වූ බවත්, එහි දී එම ප්‍රදේශවාසීන් මෙම ඉල්ලීම සිදු කළ බවත්, යුධ හමුදාවේ සේවය කරමින් සිටිය දී මිය ගිය රණවිරුවන් තිදෙනෙකුගේ නිවාස එම මාර්ගයේ පිහිටා තිබෙන බවත්, ඔවුන්ට ගෞරවයක් ලෙස මෙම මාර්ගය රණවිරු මාවත ලෙස නම් කිරීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනා කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම සභාව ඉතිහාසයේ දී, කිසිඳු හේතුවකට සභාව සතු මාර්ගයක් පුද්ගලික නමකින් නම් නොකරන බවට තීන්දුවක් ගෙන තිබෙන බවත්, පුද්ගලික නමක් ඉදිරිපත් වී නොමැති බැවින් මෙම නාමය එම මාර්ගයට යෙදීමේ හැකියාව පවතින බවත්, ඒ සඳහා අවශ්‍ය අනෙකුත් නීත්‍යානුකූල පියවර පිළිබඳ ලේකම්තුමන් මඟින් පැහැදිලි කර ගැනීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.10 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>

ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව වීථියක් හෝ මාවතක් නම් කිරීමේ බලය ප්‍රාදේශීය සභාවට තිබෙන බවත්, 1975 අංක 04 දරන වීථි හා ස්මාරක ඉදිකිරීම් පාලනය කිරීමේ පනත අනුව මෙය නම් කිරීම සුදු කළ යුතු වන බවත්, සභා තීරණයක් ලබා ගත් විට එය විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් කිරීම නිත්‍යානුකූල ක්‍රමවේදය වන බවත්, හිටපු මහ ඇමතිතුමාගේ කාලයේ දී ජීවත්ව සිටින අයගේ පෞද්ගලික නම් වලින් පාරවල් නම් නොකරන ලෙස චක්‍රලේඛයක් මඟින් දැනුම් දුන් බවත්, මීට අමතරව මහ සභාව මඟින් පාරවල් නම් කිරීම සම්බන්ධව තීරණ ගැනීමේ හැකියාව පවතින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා</u>

මෙය ගැසට් කරන ලද පාරවල් සඳහා පමණක් වලංගු වන්නක් දැයි විමසන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

සියලුම මාර්ග ගැසට් කළ යුතු වන බවත්, එය සභාව මඟින් ඉටු කළ යුත්තක් වන බවත් පැහැදිලි කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

අපට අයිති ගොඩක් මාර්ග තිබුණත් ඒවා ප්‍රාදේශීය සභාවට අයිති මාර්ග ලෙස නොමැති බවත්, ප්‍රාදේශීය සභාවෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒවා සංවර්ධනය කර ඇති බවත්, මේ සමඟම එම මාර්ග ද ගැසට් කිරීම සුදුසු වන බවත්, බොහෝ දෙනෙක් මෙම මාර්ග පුද්ගලික මාර්ග ලෙස සලකා කටයුතු කරමින් පවතින බවත්, එසේම මාර්ගයන් වල කොටස් නම් කිරීමේ දී අවහලාගේ නිවසේ සිට අහවලාගේ නිවස දක්වා ලෙස දැක්වීමට වඩා එම මාර්ගවල පටුමඟවල් අංක කර ඒ අනුව එම ස්ථාන හැඳින්වීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා</u>
මේ සඳහා ලේඛනයක් සකස් කළ බවත්, මින් පෙර ලබා ගත් ලේඛනයේ බොහෝ පාරවල් ඇතුළත්ව නොතිබූ බවත් සඳහන් කරන ලදී.

<u>ලේකම්, ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මහතා</u>
මේ දිනවල සභාවේ මාර්ග ඉන්වෙන්ට්‍රිය සෑදීමේ කටයුතු සිදු කරමින් පවතින බවත්, එය අවසන් වූ පසු ඇමතිවරයා වෙත යොමු කොට අනුමැතිය ලබාගෙන සහා තීරණයක් ගෙන ගැසට් කිරීමේ කටයුතු සිදු කළ යුතු බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
මේ වන විට මාර්ග ඉන්වෙන්ට්‍රියේ කටයුතු සිදු කරමින් පවතින බවත්, දැනට 90% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇති බවත්, මේ වර්ෂය අවසාන වීමට පෙර එය සම්පූර්ණ කර ගැසට් කිරීමට හැකිවන බවත්, ආරම්භයේ දී නිවාසයක් දෙකක් පමණක් තිබූ පුද්ගලික මාර්ග විකාශනයත් සමඟ නිවාස වැඩි වන විට පොදු මාර්ග බවට පත් වූවත් තවමත් පැරණි ආකාරයටම භාවිත වන බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.20 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.6.** **<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රන්ජිත් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.6.1. දෝපේ කොට්ඨාසයේ ධර්මපාල කනිටු විදුහලේ සිට සිරිසුමනාරාම පාර දක්වා ඇති දිග මීටර් 408 ක් හා පළල අඩි 08 ක් වූ ධර්මපාල මාවතේ ස්ථාන 04 ක තාර පාර අබලන් වී ගමනාගමනයට අපහසු තත්ත්වයේ ඇති බැවින් පෙරමුසු යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.6.2. දෝපේ කොට්ඨාසයේ සිරිසුමනාරාම පාරේ සිට සුනිල් ඉලෙක්ට්‍රිකල් දක්වා දිග මීටර් 520 ක් වූ සමෘද්ධි මාවත කුඩා වැස්සකට පවා අඩියක් පමණ යටවන අතර මෙම කොටස දෙපස කාණු පද්ධතිය යථාවත් කර මාර්ගයේ ගමන් පහසුව ඇති කිරීම හා එම කොටසේ ස්ථාන 02 ක තාර කොටස් ගැලවී ඇති බැවින් පෙරමුසු යොදා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, උබේසිංහ ආරච්චිගේ රංජිත් මැතිතුමා</u>

කොට්ඨාසවලට යම් යම් සහන ලබා දුන්න ද මාර්ග පද්ධති සම්බන්ධයෙන් යම් දුර්වලතාවයක් පවතින බවත්, කිසිවක් සිදු නොකෙරු බවට මාගේ කොට්ඨාසයේ ජනතාවගෙන් පැමිණිලි ලැබෙන බවත්, මා විසින් ද එය නිරීක්ෂණය කළ බවත්, දෝපේ කොට්ඨාසය නියෝජනය කරනු ලබන එකම මහජන නියෝජිතයා තමන් වන බැවින් ලකුණු දා ගැනීමේ අරමුණින් නොව ජනතාවට සෙත සැලසීමේ අරමුණින් නැවත මේ පිළිබඳ සලකා බලා සියලුම කොට්ඨාස වෙත සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරන ලෙස නව සභාව ආරම්භ කොට වර්ෂයක් සපිරෙන මෙම මෙහොතේ මතක් කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

පසුගිය වසරේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් නොවූ කොට්ඨාස 03 සඳහා ද මෙම වසරේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, ඒ අනුව එම කොට්ඨාසවල ද මාර්ග එකක් හෝ කීපයක් සංවර්ධනය කිරීමට හැකිවන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.7. <u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

5.7.1. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව අලුත්වත්ත පිවිසුම් මාර්ගයේ ආරම්භක ස්ථානයට හියුම් පයිප්ප 02 ක් දමා ජලය බැස යාමට හැකිවන ලෙස සකස් කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

මෙම යෝජනාව මීට පෙර ද ඉදිරිපත් කළත් මේ වන විට මාස 06 කාලය ඉක්මවා ගොස් ඇති බැවින් නැවත ඉදිරිපත් කරන බව සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.7.2. වියන්දූව ග්‍රාම නිලධාරී වසමේ වියන්දූව මරුමුල්ලකැළේ නැමති වෙන්දේසි ඉඩමේ සභාව සතු ඉඩම් කොටස ක්‍රීඩා පිටියක් ලෙසට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>
මෙම යෝජනාව ද මීට පෙර ඉදිරිපත් කළත් මේ වන විට මාස 06 ක කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින් නැවත යෝජනා කරනු ලබන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා</u>
මෙය ක්‍රීඩා පිටියක් ලෙස සකස් කර දෙන ලෙස ගමේ තරුණ ප්‍රජාවගේ විශාල ඉල්ලීමක් තිබෙන බවත්, මෙය ඉටු කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.8.** <u>**ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.**</u>

5.8.1. පසුගිය දිනක කොන්ක්‍රීට් කරන ලද බෙන්තොට ගා/ මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩාංගනයට ගමන් කරන පිටුපස පාර (ඔබඩවත්ත පාර) දෙපස කාණු ගොඩවී වැසී ඇති බැවින් එහි දෙපස කාණු කපා සකස් කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>
මේ වන විට මෙම මාර්ගය සංවර්ධනය කර ඇති අතර දෙපස කාණු ගොඩවී ඇති බැවින් ජලය ගලා යාමට නොහැකිව මාර්ගය ජලයෙන් යටවන බැවින් මෙම මාර්ගය දෙපස කාණු පද්ධතිය පිරිසිදු කිරීම සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>
එම මාර්ගය හොඳින් සංවර්ධනය කර ඇති බවත්, මේ වන විට මාර්ගය උස් වන ලෙස සකස් කර ඇති නිසා දෙපස කාණු පද්ධතිය වතුර බැස යාම සඳහා අත්‍යවශ්‍ය වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.8.2. බෙන්තොට පිටාරඹ "බිමල් විලා" හා තවත් ගෙවල් කීපයකට යන පාරේ රේල් පාරට කිට්ටු මීටර් 15 ක පමණ කොන්ක්‍රීට් කර නොමැති කොටස කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික සේරසිංහ මැතිතුමා</u>
මෙම මාර්ගයේ කොටසක් පමණක් කොන්ක්‍රීට් කර ඇති බවත්, තවත් නිවාස 15 කට ආසන්න ප්‍රමාණයකට ගමන් කිරීමට මෙන්ම වෙරළට, හෝටල් වෙත හා දුම්රිය අංගනයට ද පිවිසිය හැකි මෙම මාර්ගයේ ඉතිරි

කොටස ද කොන්ක්‍රීට් කර දෙන ලෙස එම නිවැසියන්ගෙන් ඉල්ලීම් ලැබෙන බවත්, මෙම මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.9. <u>ගරු මන්ත්‍රී ලියනගමගේ අභයරත්න, ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට, ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ හා ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න යන සභිකවරුන් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>**

5.9.1. දෙල්කබලගොඩ වසමේ පරුස්සගොඩ මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>**
මෙම මාර්ගයේ මීටර් 100 ක පමණ ප්‍රමාණයක් තිබෙන බවත්, භාණ්ඩ මිල ඉහළ යාමත් සමඟ මෙම මාර්ගය සඳහා සකස් කර තිබූ ඇස්තමේන්තුගත මුදල ප්‍රමාණවත් නොවූ බවත්, මේ වන විට නව ඇස්තමේන්තුවක් මේ සඳහා සකස් කර ඇති බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.10. <u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.10.1. දකුණු පළාත් සභා ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලි බල සහ ග්‍රාමීය හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලබා දීමට යෝජිත ප්‍රතිපාදන යටතේ මුල්ලෙගොඩ, යාලෙගම, ගල්බඩ ගම්මානය හරහා ඇති මාර්ගයේ (බණ්ඩාරනායක මාවත) කොටසක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.2. ප්‍රාදේශීය සභාවේ ගලි බවුසරයට අදාළ මෝටරය අක්‍රීය වී ඇති අතර එය අලුත්වැඩියා කිරීමට විශාල මුදලක් වැයවන බැවින් අලුතින් ගලි මෝටරයක් මිල දී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ගලි බවුසරය මේ වන විට ඉතා පැරණි තත්ත්වයේ පවතින බැවින් දිගින් දිගටම නව ගලි බවුසරයක් සඳහා ඉල්ලීම් සිදු කර ඇති බවත්, නව ගලි මෝටරයක් ගැනීමට වැය වන මුදලට වඩා අක්‍රීය මෝටරය අලුත්වැඩියාවට රු. 10,000 – 15,000 ක අතර මුදලක අඩුවක් පමණක් පවතින බැවින් නව ගලි මෝටරයක්ම මිල දී ගැනීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.3. 2026 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින පාසල් දූ දරුවන් වෙනුවෙන් ප්‍රවීණ සම්පත්දායකයින් මඟින් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වීමටත්, ඒ වෙනුවෙන් සභා අරමුදලින් රු. 355,000/- ක වැය බරක් දැරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

බෙන්තර බල ප්‍රදේශයේ මෙවර ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දෙන දූ දරුවන් වෙනුවෙන් මෙම සම්මන්ත්‍රණය පැවැත්වීමට කටයුතු කරන බවත්, පසුගිය වසරේ ද ශිෂ්‍යත්ව සමතුන් වෙනුවෙන් උත්සවයක් පැවැත්වීමට යෝජනා කළ ද එය ඉටු කළ නොහැකි වීම පිළිබඳ කණගාටු වන බවත්, මෙවර වැඩි වියදමක් දරමින් හෝ ප්‍රවීණ සම්පත්දායකයින් ගෙන්වා දරුවන්ට ද කුඩා ෆයිල් කවරයක් මෙන්ම ආහාර වේලක් ආදිය ලබා දීමට කටයුතු කරමින් මෙම වැඩකටයුත්ත සිදු කරන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.4. සභාවේ කොන්ක්‍රීට් මික්සරය අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින අතර සෘජු ශ්‍රමික පදනම යටතේ සිදු කරනු ලබන කර්මාන්තයන් සඳහා මෙම යන්ත්‍රයේ අවශ්‍යතාවය දැඩි ලෙස බලපානු ලබයි. එම නිසා මෙම යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.5. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රදාන ලබා දීම යටතේ ගෝනගලපුර පොදු වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ කඩ කාමර 11 ක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා දීමට යෝජිත අතර ලබා දෙන ප්‍රතිපාදනයන්ට අමතරව මුදලක් වැයවේ නම් එම මුදල සභා අරමුදලින් දරා උක්ත ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.10.6. ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා සිදු කිරීමට නියමිත පහත සඳහන් කර්මාන්තවලට අදාළ ඇස්තමේන්තු පිළිගෙන සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ/ කර්මාන්තයේ නම | ඇස්තමේන්තුගත මුදල (රු.) |
|---|---|---|
| 01 | සූරියගම භාෂිත මහතාගේ නිවස අසල සිට රවී මහතාගේ නිවස අසල දක්වා වූ කොටස තාර දැමීම | 319,494.08 |
| 02 | තුඩුව උළුකැපුවත්ත ප්‍රධාන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 302,081.80 |
| 03 | දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2026, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන, ප්‍රජා ජල අංශය යටතේ ප්‍රතිපාදන අනුමතව ඇති දෙද්දුව ප්‍රජා ජල ව්‍යාපෘතිය | 2,000,000.00 |
| 04 | මහ ඌරගහ පරුස්සගොඩ පාර කොන්ක්‍රීට් කිරීම | 1,271,772.99 |
| 05 | මහගොඩ ඥාණිස්සර මාවත 03 වන පටුමග ප්‍රදීප් ගුණවර්ධන මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම | 722,487.04 |
| 06 | මහගොඩ ඥාණිස්සර මාවත 05 වන පටුමග කොන්ක්‍රීට් කිරීම | 663,002.79 |
| 07 | බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ පොළොව ටයිල් කිරීම | 2,135,901.00 |
| 08 | බෙන්තොට ප්‍රාදේශීය සභා ආදාහනාගාරයේ ඇලුමිනියම් දොරවල් සහ වැහිපීලි සකස් කිරීම | 533,291.00 |
| 09 | දෝපේ තන්තිරිගෙවත්ත හරස් පාර කොන්ක්‍රීට් කිරීම | 594,866.00 |
| 10 | දෙද්දුව මහගෙදරවත්ත ප්‍රධාන පාර (විලියම් ගුණරත්න පාර) තාර දැමීම | 211,336.56 |
| 11 | දෙද්දුව බොල්ගොඩ මාර්ගයේ ජයලත් මහතාගේ නිවස අසල සිට සුසාන භූමියට හැරෙන ස්ථානය දක්වා කොටස තාර දැමීම | 290,587.77 |
| 12 | දංකැටිය ජේම්ස් සමරසිංහ මාවත කොන්ක්‍රීට් කිරීම | 421,986.30 |
| 13 | දෝපේ වේරගොඩවත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 385,131.78 |
| 14 | පළාත් පාලන ආයතනවල කුඩා පාලම් වැඩිදියුණු කිරීමේ තිරසාර ව්‍යාපෘතිය - 2026 යටතේ රන්තොටුවිල ආචාරිගේ වත්ත පාලම ඉදි කිරීම සඳහා වන සංශෝධිත ඇස්තමේන්තුව | 12,591,844.27 |
| 15 | හුංගන්තොට ප්‍රධාන මාර්ගයේ සිට දිවෙන කොටපිටියවත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 261,691.45 |
| 16 | සිංහරූපගම සිරිසේන නානායක්කාර මහතාගේ නිවස ඉදිරිපිට වම් පසට ඇති ඩබ්ලින් මියගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 669,869.65 |
| 17 | පිටාරඹ පන්සල පසුකර වමට ඇති මාර්ගයේ රාජපක්ෂ මහතාගේ නිවස ඉදිරිපස පසුකර ඉදිරියට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 471,422.97 |
| 18 | ආරච්චිමුල්ල කෝම්මල පාරේ සිට දිවෙන උස්වත්ත පටුමග කොන්ක්‍රීට් කිරීම | 508,574.80 |

| | | |
|---|---|---|
| 19 | ආරච්චිමුල්ල කෝම්මල පාරේ සිට දිවෙන ගොරකදූව පාරේ නිතර ජලයෙන් යටවෙන කොටස කොන්ක්‍රීට් කිරීම | 509,574.80 |
| 20 | සිංහරූපාගම ග්‍රේස් විලා පසුකර යනවිට ඇති කඩය අසලින් වමට ඇති දිලීප් මහතාගේ නිවසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 682,154.50 |
| 21 | ඉඳුරුව ඔලගන්දූව මාර්ගයේ කාපට් මාර්ගයේ අවසානයේ සිට ඉදිරියට සුසාන භූමිය දක්වා මාර්ගය තාර දැමීම | 1,800,000.00 |
| 22 | ඔලගන්දූව මාර්ගයේ අබලන්වී ඇති ස්ථාන තාරදමා පිළිසකර කිරීම | 463,000.00 |
| 23 | උත්සව අවස්ථා හා රැස්වීම්වලට ගෝනගල සතිපොළ භූමිය යොදා ගත හැකි පරිදි එහි ස්ථිර වේදිකාවක් ඉදි කිරීම. | 816,158.20 |
| 24 | මුල්ලෙගොඩ, යාලෙගම, ගල්බඩ ගම්මානය හරහා මුහුද දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීම | 2,000,000.00 |

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.11.** __ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-__

5.11.1. බෙන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සිංහරූපාගම ප්‍රජා ශාලාවේ දේශීය වෛද්‍ය සායනයක් ජූලි මස 01 වන දින සිදු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.11.2. එම වෛද්‍ය සායනය සඳහා අවශ්‍ය කරනු ලබන ආයුර්වේද බෙහෙත් ලබා දීම මෙන්ම එහි අනෙකුත් වියදම් වෙනුවෙන් රු. 10,000/- ක මුදලක් සභා අරමුදලින් වෙන් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.12.** **<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.12.1. අංක 40 ඩී ඉහළ මාලවල ග්‍රාම නිලධාරී වසමේ නුගේඩුමුල්ල මංසන්ධියේ සිට මීගස්පිටිය මහ පන්සල (කයිලත්ත) අසලට වැටෙන මාර්ගයේ කඩතොළු වී ඇති තැන් පිළිසකර කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා</u>**
මෙම යෝජනාව මා විසින් මීට පෙර ද ඉදිරිපත් කළ බවත්, තාක්ෂණ සේවා නිලධාරීතුමන් ද මෙම ස්ථානය පරීක්ෂා කළ බවත්, ගල් කියුබ් කීපයක් දමා හෝ එම ස්ථානය උස්වන ලෙස සකස් කර දීම සුදුසු බවත්, වර්ෂා අවස්ථාවල දී මෙම ස්ථානයෙන් ගමන් කළ නොහැකි තත්ත්වයක් මතුවන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.13.** **<u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.13.1. යාලේගම මංසන්ධියෙන් හැරී කිලෝමීටරයක් පමණ ගියපසු හමුවන ඉතාම අබලන් තත්ත්වයේ පවතින පුංචිවෙල්ල පාර පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.14.** **<u>ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.14.1. බෙන්තොට බෝධිමලුව කනත්තවත්ත පාර රවුම් පාර ආරම්භ වන ස්ථානයේ බිම පහත් මට්ටමක පැවතීම මෙන්ම දෙපස කාණු අවහිරව පැවතීම හේතුවෙන් බෙන්තොට රවුම් පාර සිට බෝධිමලුව කනත්තවත්ත (පොල්වත්ත) පාරේ ආරම්භයේ හියුම් පයිප්ප යොදා බොක්කුවක් සකස් කර දෙන මෙන් යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**</u>
මෙම ස්ථානය තාක්ෂණ සේවා නිලධාරීතුමන් විසින් පරීක්ෂා කළ බවත්, ඒ අනුව එම ස්ථානයට හියුම් පයිප්ප යොදා ජලය බැස යාමට හැකි වන ලෙස සකස් කළ හැකි බවට දැනුවත් කළ බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.14.2. බෙන්තොට වඩුමුල්ලේ, කපුමුල්ල පාරේ ප්‍රධාන බෝක්කුවට සම්බන්ධ ඇළ මාර්ගයේ වම්පස කොටස අවහිර වී පවතින අතර එය සභාවේ බැකෝ යන්ත්‍රය යොදවා ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**</u>
මේ හේතුවෙන් ඒ අවට ඉඩම් ජලයෙන් යටවන බවත්, මෙම අවහිර වී පවතින කොටස ජලය බැස යන ලෙස සකස් කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.14.3. සභාවේ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවලට අදාළව එහි අවශ්‍යතාවය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීමේ අරමුණින් ඊට අදාළ ඡායාරූප, වීඩියෝ වැනි දෑ සභාව වෙත ඉදිරිපත් කිරීමට හැකිවන ලෙස සභාවේ මාසික රැස්වීමට මල්ටිමීඩියා යන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා**</u>
සම්බන්ධීකරණ කමිටුවේ දී ද මෙය සිදු කරන බවත්, ගැටලුව මෙන්ම එහි ප්‍රගතිය ද මේ හරහා පෙන්විය හැකි බවත්, මීළඟ මාසික රැස්වීමේ සිට මෙය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට ප්‍රධාන හේතුව අනතුරුදායක ගස් පැවතීම වන බවත්, මෙම ගස් පාරට මෙන්ම විදුලි හා දුරකතන රැහැන්වලට අනතුරුදායක ලෙස පවතින බවත්, දැන්විය යුතු සියලුම පාර්ශ්වයන් මේ සම්බන්ධව දැනුවත් කොට තිබෙන නමුත් මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත්, ලංකාවේ ආපදා කළමනාකරණය විසින් රැස්වීම්, වැඩමුළු ආදිය පවත්වන නමුත් අනතුරක් සිදුවන තෙක් ඒ පිළිබඳ කටයුතු නොකරන බවත්, අනතුරු සිදු වූවායින් පසු ඒ සඳහා විසඳුම් ලබා දීමට ක්‍රියාත්මක වන බවත්, පසුගිය දිනක නාවලපිටියේ සිදු වූ සිදු වීමේ දී එම ගස කපා ඉවත් කර තිබුණේ නම් එම අනතුර වලක්වාගෙන ජීවිත බේරා ගැනීමට හැකියාව තිබූ බවත්, අප  සභාවට ද එවැනි ඉරණමකට මුහුණ දීමට කටයුතු සිදු වීමට පෙර මෙවැනි අනතුරුදායක ගස් ඉවත් කළ යුතු බවත්, කෝම්මල ප්‍රදේශයේ පමණක් අනතුරුදායක ගස් 30 ක් පමණ තිබෙන බවත්, ඉදිරියේ දී මෝසම් සුළං ආරම්භ වීමට නියමිත බවත්, ඒ වගේම දෙවන වරට ද තම පුද්ගලික වියදමින්

මාර්ගයක් ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ නිහාල් මැදගොඩ මැතිතුමාට ස්තූතිවන්ත වන බවත්, තව තවත් එවැනි පුණ්‍ය කටයුතු සඳහා ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

මෙම අනතුරුදායක ගස් ඉවත් කිරීම ආපදා කළමනාකරණයට තනිවම සිදු කළ හැක්කක් නොවන බවත්, අතීතයේ දී විදුලි බල මණ්ඩලය සහ ටෙලිකොම් ආයතනය තම ආයතනයන් විසින් සවි කරන ලද රැහැන් පද්ධති හා කණුවලට බරවී ඇති අනතුරුදායක ගස්, අතු තිබේ නම් එම කණු E අකුරින් සලකුණු කොට ගස්, අතු කපා ඉවත් කරනු ලැබූ බවත්, නමුත් වර්තමානයේ එම කටයුත්ත කොන්ත්‍රාත් ආයතන වෙත ලබා දී ඇති බවත්, ඒ හරහා නිසි ලෙස එම කටයුත්ත සිදු නොවන බවත්, රැහැන්වලට ගැවෙමින් පවතින පොල් අතු කෙසෙල් අතු වැනි දෑ පමණක් කපා දමන බවත්, නමුත් වයර්වලට නොගැවී ඊට ඉහළින් විශාල අතු වැඩී තිබෙන බවත්, මෙවැනි මාර්ග ආසන්නයේ පවතින ගස් මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් සභාවට, පුද්ගලික අයිතිකරුන්ට මෙන්ම අප සභාවට ද අයත් වන ලෙස පවතින බවත්, එම පවතින බහුතරයක් අනතුරුදායක වන බවත්, අනතුරුදායක බව ජනතාව පැවසූ පමණින් එය නිර්ණය කිරීමට ද හැකියාවක් නොමැති බවත්, එතරම් විශාල ගස් ප්‍රමාණයක් කපා දැමීමට සභාව තුළ ප්‍රතිපාදන ද නොමැති බවත්, එම නිසා මෙම යෝජනාව සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කර ඒ හරහා ආපදා කළමනාකරණය වෙත දන්වා අදාළ ආයතන සියල්ල එකතු කොට කමිටුවක් හෝ පත් කොට මේ සඳහා කටයුතු සිදු කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මැතිතුමියගේ නිවසේ ඉදිරිපිට තිබෙන ගසත් ඊට පිටුපසින් ඇති තවත් ගසකුත් කපා ඉවත් කිරීමට පසුගිය සම්බන්ධීකරණ කමිටුවේ දී ද යෝජනා ඉදිරිපත් වූ බවත්, මේ වන විට ඒ සම්බන්ධයෙන් තුන් වතාවක් පමණ දැනුම් දීම් සිදු කළ ද මෙතෙක් එම ගස් කපා ඉවත් කර නොමැති බවත්, එම නිවසට අල්ලපු නිවසට මේ වන විට තුන් හතර වතාවක්ම පිටුපසින් ඇති ගසේ අතු කඩා වැටී තිබෙන බවත්, අනෙක් ගස මාර්ගය ආසන්නයේම පවතින බැවින් මාර්ගයට කඩා වැටුණොත් විශාල අනතුරක් සිදු වීමට ඉඩ ඇති බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ඒ ගස් සම්බන්ධයෙන් සභාවෙන් ලිපි නිකුත් කළ ද මෙතෙක් ක්‍රියාත්මක වී නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් එම පාර්ශ්වයෙන් සඳහන් කරනු ලබන්නේ එම ගස අවුරුදු 100 කට වඩා පැරණි වන බවත්, එය කපා ඉවත් කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අවසර ගත යුතු බවටත්, මෙවැනි දෑ හේතුවෙන් ගස් කපා ඉවත් කිරීම දුෂ්කර කටයුත්තක් වන බවත්, නමුත් යම් අනතුරක් සිදු වුවහොත් එහි පූර්ණ වගකීම සභාව වෙත පැටවෙන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.15.** <u>**ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-**</u>

5.15.1. හබුරුගල නීතිඥ එම්. ඩී. පියසේන මාවත ප්‍රතිසංස්කරණය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් වමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
පසුගිය දිනක එම මාර්ගය සභාවේ කම්කරුවන් යොදා පිරිසිදු කළ බවත්, ආරම්භක ස්ථානයේ මීටර් 50 ක පමණ කොටසක විශාල වලවල් සෑදී තිබෙන බවත්, ඇලකාක වසම දක්වා මෙම මාර්ගය ගමන් කරන බවත්, නිවාස 50 කට වැඩි ප්‍රමාණයක් මෙම මාර්ගයේ පවතින බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.15.2. හබුරුගල, තුඩුව - ගෝනගලපුර මාර්ගයේ පොඩි බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
එම බෝක්කුව පිළිබඳ වාරිමාර්ගයෙන් විමසීම් කළ බවත්, එහි දී එය ප්‍රාදේශීය සභාවට අයත් බව දැන්වූ බවත්, තාක්ෂණ සේවා නිලධාරීතුමන් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ බවත්, එම බෝක්කුව මේ වන විට ගිලා බැස ඇති බවත්, පසුගිය කාලයේ මෙම මාර්ගයේ පස් ඇදීම් සිදු කළ බවත්, මේ හේතුවෙන් එම මාර්ගයේ බෝක්කු 02 ක් ගිලා බැස ගිය බවත්, අවසානයේ මාර්ගය සකස් කර දෙන ලෙස ඉල්ලා ප්‍රදේශවාසීන් මාර්ගය වසා දමන තත්ත්වයට ද පත් වූ බවත්, එම මාර්ගයේ ඉඩම් කට්ටි කිරීමේ ව්‍යාපෘති දෙකක් ද තිබූ බවත්, ඒවායින් පස් ඇදීම හේතුවෙන් මාර්ගයට මෙය සිදු වූ බවත්, ග්‍රාම සේවා වසම් 8 ක පමණ ජනතාව දිනපතා ගෝනගලට යාමට මෙම මාර්ගය භාවිත කරන බවත්, කඩිනමින් මෙම බෝක්කුව සකස් කර දෙන ලෙසට සභාවෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.50 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

<u>තාක්ෂණ සේවා නිලධාරී, එස්. ඩී. සමරනායක මහතා</u>
මේ වන විට බෝක්කුවේ එක් පැත්තක් ගිලා බැස ඇති බවත්, එය සම්පූර්ණයෙන් ඉවත් කොට අඩි 2 ½ පමණ හියුම් පයිප්ප 02 ක් අලුතෙන් දැමීමට සිදුවන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>
එම මාර්ගයේ ලී මෝල් පවතින බවත්, ඒ හේතුවෙන් කොට පටවන ලද වාහන ද ගමන් කරන බවත්, පස් ඇදීම ද සිදු කරන බවත්, මේ නිසා හියුම් පයිප්ප යෙදීම ප්‍රමාණවත් නොවන බවත්, එය නිසියාකාරව සංවර්ධනය කිරීම සඳහා ආසන්න වශයෙන් ලක්ෂ 50 කට අධික මුදලක් වැය වන බවත්, සභා අරමුදලින් එතරම් වියදමක් දැරීමට නොහැකි නිසා ආණ්ඩුකාරතුමා දක්වා මේ පිළිබඳ අවශ්‍යතාවය දක්වා ලිඛිතව

ඉල්ලීම් සිදු කර ඒ මඟින් හෝ වෙනත් අයුරකින් හෝ ප්‍රතිපාදන වෙන් කරවාගෙන මෙය සකස් කිරීම සුදුසු වන බවත්, මාර්ගයේ ගමන් කරන වාහන සම්පූර්ණයෙන් නවතා දැමීමේ හැකියාවක් නොමැති බැවින් එය සංවර්ධනය කරන තෙක් "බෝක්කුව අබලන් වී ඇති බැවින් බර වාහන ගමන් කිරීම අනතුරුදායක බැවින් තාවකාලිකව එය නවතා දමන්න" ලෙස සඳහන් පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සිදු කළ හැකි බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 10.55 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.15.3. බෙන්තොට ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට සීසීටීවී පද්ධතියක් සවි කිරීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
වර්තමානයේ සෑම ස්ථානයකම සීසීටීවී පද්ධති සවි කර තිබෙන බවත්, ලේකම්තුමාගේ හා සභාපතිතුමාගේ කාමර දෙකට මොනිටර් 02 ක් සවිකර දර්ශන නැරඹීමට හැකි වන ලෙස සකස් කළ හැකි බවත්, ආයතනය තුළට පිටස්තර ඕනෑම අයෙකුට පැමිණ පිටවීමේ හැකියාව පැවතීම අනාරක්ෂිත බවත්, ආයතනය තුළ තිබෙන දෑ සොරාගෙන යාමට ද ඉඩ තිබෙන බවත්, යම් දෙයක් සිදු වූ විට සේවකයන් සැක කිරීම සිදු කරනවාට වඩා මෙය ඉතා වටිනා විසඳුමක් වන බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.15.4. දංකැටිය සෝමානන්ද මාවතේ ජලය එක්රැස්වීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගැනීමට සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී නිලුපුල් සම්පත් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>
දංකැටිය කන්දෙන් පල්ලමට බසිනවිටම තිබෙන පාරට පහළින් තිබූ පාර හරහා කලින් ජලය ගලා ගිය බවත්, මේ වන විට එම පාර මධ්‍යම රජයේ ප්‍රතිපාදන යටතේ කොන්ක්‍රීට් අතුරා ඇති බවත්, මේ නිසා ඒ අයිනෙන් තිබූ කාණුව තරමක් වැසී ගොස් ඇති බවත්, කාණු කොටස තිබුණ ද බෝක්කුව ඒ පැත්තෙන් වැසී ගොස් ඇති නිසා පාර මධ්‍යයේ ජලය එක්රැස් වී පවතින බවත්, තාක්ෂණ සේවා නිලධාරී මඟින් ස්ථානීය

පරීක්ෂාවක් සිදු කර එම ජලය ගලා යාමට බැස්මක් සකස් කිරීමට ප්‍රාදේශීය සභාවේ මැදිහත් වීමක් අවශ්‍ය බවත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.15.5. හබුරුගල එක්සත් ප්‍රජා කමිටුව මඟින් කමිටුවේ මුදලින් පුටු 50 ක් ලබා ගැනීමට යෝජනා කළ අතර ඒ සඳහා රු. 60,000/- ක මුදලක් එම කමිටු ගිණුමෙන් ලබා ගැනීමට අවසර ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.16.** **<u>ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>**

5.16.1. පිලේකුඹුර ප්‍රධාන මාර්ගය දෙපස පිළිසකර කර තරංග හේවාවසම් මහතාගේ නිවස ඉදිරිපිට ස්ථානය, නිමල් හෙට්ටිආරච්චි මහතාගේ නිවස ඉදිරිපිට ස්ථානය ඇතුළුව ජලය නිසියාකාරව බැස නොයන ස්ථාන පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.2. පිලේකුඹුර අතුරු මාර්ග පද්ධතිය දෙපස පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිණී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.3. 4 E කොළණිය වසමේ ඇටඹගහ මාර්ගය දෙපස සෝදාපාළුවන ස්ථාන (පිටවාන අසල) හා අවහිර ගස් ඉවත් කර පිළිසකර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා**</u>

එම මාර්ගයේ ස්ථානයක කුඹුරේ පිටවාන එය භාවිත කරන මිනිසුන් විසින් කපා ඇති බවත්, තව නොබෝ දිනකින් එය කොන්ක්‍රීට් එක ද කඩාගෙන යාමට ආසන්නව පවතින බවත්, මාර්ගයේ අනෙක් පස කුරුඳු වගාවක් පවතින බවත්, එහි අතු පාරට බරව පිහිටන බවත්, මේ නිසා මාර්ගයේ අඩි 6 ක පමණ ප්‍රමාණයෙන් ගමන් කිරීමට ඉතිරිව ඇත්තේ අඩි 2 ක පමණ කොටසක් පමණක් බවත්, කඩිනමින් පිළිසකර කිරීම සුදුසු වන බවත් සඳහන් කරන ලදී,

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.4. ඇටඹගහ මාර්ගය අබලන් වී ඇති ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.16.5. මාසික සභා රැස්වීම් වාර්තාකරණය කිරීම සඳහා ආරම්භයේ සිට සභාවට මෙතෙක් පැමිණි මාධ්‍යවේදීන් තිදෙනා සඳහා සුදුසු ක්‍රමවේදයක් යටතේ ගමන් වියදම් දීමනාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඉඳුරුවගේ ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, සෞම්‍ය කුමාර ද සිල්වා මැතිතුමා**</u>

මෙම මාධ්‍යවේදී මහත්වරුන් ආරම්භයේ සිටම පැමිණ මහ සභා රැස්වීමේ කටයුතු අවශ්‍ය ආකාරයට වාර්තාකරණයේ යෙදෙන බවත්, වර්තමාන ආර්ථික තත්ත්වය හමුවේ ඔවුන් සඳහා ගමන් වියදමක් ලබා දීමේ හැකියාවක් පවතින්නේ නම් එය ඔවුනට යම් පහසුවක් වන බවත්, සභා ආරමුදලින් මෙම ගමන් වියදම ලබා දීමේ හැකියාවක් පවතින්නේ නම් එය ඉටු කර දෙන ලෙසත්, එසේ නොහැකි නම් මීට පෙර සභා කාලවල දී සිදු කළ ආකාරයට සභිකවරුන්ගේ එකඟතාවය මත ඒ අයගෙන් යම් මුදලක් අයකර එය ලබා දීමට කටයුතු කරන ලෙසත් සඳහන් කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>5.17. ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-</u>

5.17.1. සව්සිරි උයන ඉඩම් කට්ටියට පිවිසෙන අභ්‍යන්තර මාර්ගය පස් කපා ඉවත් කර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

5.17.2. ඉන් ඉවත් කරනු ලබන පස් මහවිල පන්සල ඉදිරිපිට වෙල් යාය මැදින් ඇති සව්සිරිය ඉඩම් කට්ටියට පිවිසෙන මාර්ගයට යොදා පුරවා දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**5.18. ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යථා පරිදි කල් නොදුන් යෝජනා :-**

5.18.1. රංතොටුවිල ප්‍රධාන මාර්ගයේ සිට ගුරුහේන්ගොඩ කුලතුංග මහතාගේ නිවස දක්වා ඇති මාර්ගය දෙපස සභාවේ සේවක මහතුන් කීප දෙනෙකු යොදවා ශුද්ධ පවිත්‍ර කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී තිලක් උපුල් චමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාවට අදාළ එකඟතාවය ගරු සභාපතිතුමා විසින් සභාවෙන් විමසන ලදුව, විරෝධතාවයක් හෝ බෙදීමක් නොවූ බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**6. කාරක සභාවල වාර්තා සලකා බැලීම :-**

6.1. 2026.04.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.04.10 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.2. 2026.04.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.04.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී නිහාල් මැදගොඩ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.3. 2026.05.08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.05.08 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

6.4. 2026.05.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

2026.05.19 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ලෙනිකා දූෂන්ති මැතිතුමිය විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී මිගාර වලල්ලාවිට මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**7. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ වාර්තා සහ වෙනත් ලේඛන සභාවට ඉදිරිපත් කිරීම හා සලකා බැලීම :-**

**7.1. <u>2026 මැයි මස ලැබීම් හා වියදම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026 මැයි මස ලැබීම් හා වියදම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| 2026 මැයි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය | |
|---|---|
| පුනරාවර්තන ආදායම් එකතුව | රු. 10,225,208.56 |
| එකතු කළා මූලධන ලැබීම් :- | රු. 7,637.50 |
| පුනරාවර්තන හා මූලධන ලැබීම්වල එකතුව | **රු. 10,232,846.06** |
| සේවක ණය | රු. 655,802.17 |
| තැන්පත් | රු. 545,479.85 |
| දේපළ ණය පොළී | රු. 10,746.23 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 65,150.00 |
| බලපත්‍ර බදු | රු. 4,325.00 |
| වැටුප් හා වවුචර් මුද්දර බදු | රු. 3,375.00 |
| UDA සේවා ගාස්තු තැන්පත් | රු. 12,900.00 |
| 101 ට බැර | රු. 20,711.32 |
| 102 ට බැර | රු. 60,647.36 |
| 103 ට බැර | රු. 48,046.17 |
| ස්ථාවර තැන්පත් | රු. 5,000,000.00 |
| එකතුව | **රු. 16,660,029.16** |
| 2026 මැයි මස ඒකාබද්ධ වැය සාරාංශය | |
| පුනරාවර්තන වියදම් එකතුව | රු. 11,032,105.78 |

| | |
|---|---|
| එකතු කළා -ප්‍රාග්ධන වියදම් | රු. 3,818,864.59 |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වැයවල එකතුව | **රු. 14,850,970.37** |
| දේපළ ණය පොලී | රු. 10,746.23 |
| තැන්පත් | රු. 125,000.00 |
| සාමාන්‍ය අත්තිකාරම් | රු. 67,050.00 |
| සේවක ණය | රු. 453,336.00 |
| ණය හිමියෝ | රු. 1,652,643.33 |
| එකතුව | **රු. 17,159,745.93** |

**7.2. <u>2026. 05.31 දිනට බැංකු සැසඳුම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.05.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ගිණුම් අංක 2758780 දරන පොදු ජංගම ගිණුම, අංක 81618288 දරන සේවක ණය ජංගම ගිණුම, අංක 2759057 දරන කර්මාන්ත ජංගම ගිණුම යන බැංකු ගිණුම්වලට අදාළ බැංකු සැසඳුම් වාර්තා ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

**7.3. <u>2026.05.31 දිනට හිඟ ආදායම් වාර්තාව සභාවට ඉදිරිපත් කිරීම.</u>**

2026.05.31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ හිඟ ආදායම් වාර්තාව ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් සභා ගත කරන ලදී.

| ආදායම් ශීර්ෂය | බෙන්තොට/ඉඳුරුව/හබුරුගල |
|---|---|
| 1. වරිපනම් බදු | රු. 3,853,563.31 |
| 2. අක්කර බදු | රු. 191,448.00 |
| 3. 1 % බදු | - |
| 4. කර්මාන්ත /ව්‍යාපාර බදු | රු. 6,050.00 |
| 8. වෙළඳ ස්ථාන කුළී | - |
| 10. වෙළඳ බලපත්‍ර ගාස්තු | රු. 6,000.00 |
| 12.ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු | රු. 4,750.00 |
| **එකතුව** | **රු. 4,061,811.31** |

**7.4. ගෙවීම් වවුචර් අනුමත කිරීම.**

| අනු අංකය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීම් විස්තරය | ගෙවන මුදල (රුපියල්) |
|---|---|---|---|---|
| 01 | | වරකමුල්ල සමෘද්ධි සමිතියේ දිවිනැගුම ප්‍රජා මූල බැංකු ගි.අ. 15/30064 | මහ ඉඳුරුව කහවෙගම්මැද්ද මහවත්ත මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් නිදහස් කිරීම | 161,101.97 |
| 02 | | ඇතුංගාගොඩ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ මිරිස්වත්ත සමෘද්ධි ප්‍රජා මූල බැංකු ගි.අ. 3654062 | බිලූ මවුන්ටන් ළිඳ ආශ්‍රිත ඉඩමේ පොළොව හා ගේට්ටුව සකස් කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් නිදහස් කිරීම | 131,251.89 |
| 03 | | ලංකා බැංකුවේ සම්පත් සිදත් ශ්‍රී කණහැරආරච්චි ගි.අ. 87743598 | අප සභාවට අයත් LL – 7603 අංක දරන කෘෂ කැබ් රථයේ එන්ජිම අලුත්වැඩියාවට අදාළ බිල්පත් පියවීම | 567,600.00 |
| 04 | | අම්බලන්ගොඩ ලංකා බැංකුවේ රත්නතුංග කන්ස්ට්‍රක්ෂන් ගි.අ. 2758145 | ගෝනගල නව පොදු වෙළඳපොළ සංකීර්ණය සහිත දෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් නිදහස් කිරීම | 1,152,645.84 |
| 05 | | ශක්ති වැඩිහිටි සමිතියේ ගෝනගලපුර ප්‍රාදේශීය සංවර්ධන බැංකු ගි.අ. 21501150090 | මහ ඉඳුරුව අකාඩේගොඩ මැදගොඩ මාර්ගය තාර යොදා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ රැඳවුම් මුදල් නිදහස් කිරීම | 121,685.70 |

ඉහත ගෙවීම් වවුචර් ගෙවීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී මධුභාෂිකා දිල්හානි මැතිතුමිය විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී නදීෂාන් වික්‍රමරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**8. වෙනත් කරුණු**

**8.1. ටෙන්ඩර් හා මිල ගණන් :-** නැත

**8.2. ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම :-**

<u>**ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා**</u>

මැතක දී සංවර්ධනය කරන ලද හබක්කල සමුද්‍රාසන්නය අසලින් දිවෙන මර්ගයේ දැඩි ලෙස අබලන් වූ ස්ථාන කීපයක් පවතින බවත්, හංදියේ කඩය පසුකර ඉදිරියට යන විට කන්ද පල්ලමේ කොන්ක්‍රීට් එක උඩට තාර දමා ඇති බවත්, මේ වන විට ඒවා ගැලවෙමින් පවතින බවත්, බයිසිකල් මෝටර් බයිසිකල් ආදිය එම ගල් උඩ ගමන් කිරීම හේතුවෙන් ලිස්සා වැටෙන බවත්, මේ සඳහා පිළියමක් යෙදීමට කටයුතු කිරීම සුදුසු වන බවත් , ඒ වගේම එම මාර්ගයේම ඉදිරියට යන විට සමිත මන්ත්‍රීතුමාගේ නිවස පවතින ප්‍රදේශයට පිවිසීමට පෙර වෙල කොටසට පෙර ද දැඩි ලෙස අබලන් වී තිබෙන බවත් එම ස්ථානයට ද පිළියමක් යොදන ලෙසත්, ඒ වගේම මීට පෙර යෝජනා ඉදිරිපත් කළ විශාල පිරිසක් භාවිත කරනු ලබන කහවෙගම්මැද්ද හා අකාඩෙගොඩ යා කරන තුඩුපතවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා**</u>

යාලේගම පැලගස්වත්ත මාර්ගයේ ස්ථානයක විශාල වතුර වළක් තිබෙන බවත්, අවට නිවාස සියල්ල තාප්ප බැඳ තිබෙන බැවින් එම ජලය ගලා යාමට ස්ථානයක් නොමැති බවත්, එම මාර්ගය සංවර්ධනය නොකරන බවට ජනතාවගෙන් මැසිවිලි නැගෙන බවත්, කාණුවක් කපා එම ජලය බැස යාමට සලස්වන ලෙසට ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලීමක් තිබෙන බවත්, මේ සම්බන්ධව මැදගොඩ මන්ත්‍රීතුමාගෙන් ද ප්‍රදේශවාසීන් විසින් ඉල්ලීමක් සිදු කර තිබූ බවත්, එය ඉටු කර දීමට කටයුතු සිදු කිරීම සුදුසු බවත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා**</u>

අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා දෙන්නේ නම් එම මාර්ගයේ කටයුතු සිදු කර දීමට හැකි බව සඳහන් කරන ලදී.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා**</u>

නැවත වතාවක් තම දායකත්වය ලබා දී මෙම මාර්ගය ද සකස් කිරීමට ඉදිරිපත් වීම සම්බන්ධයෙන් මැදගොඩ මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වන බව සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, පුණ්‍ය ශ්‍රීලාල් මැතිතුමා**</u>

මීට පෙර මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව කොටුව බැන්දහේනට පිවිසෙන මාර්ගයේ ඇළ මාර්ගයට ආරක්ෂිත වැටක් ඉදි කර දීම වෙනුවෙන් සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තූතිවන්ත වන බවත්, ඒ වගේම කොටුවබැන්දහේන මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින දුෂ්කර මාර්ගයක් වන බැවින් JCB යන්ත්‍රයක් යොදවා එම මාර්ගය පිළිසකර කර දෙන ලෙසත්, මේ වන විට අනුමැතිය සඳහා යොමු කර ඇති මාර්ගයේ ඉඩම් කට්ටි කල ඉඩමක් පවතින බවත්, එහි ප්‍රවේශ මාර්ගය මාර්ගයටම පස් කපා සකස් කරගෙන ඇති බවත්, කාණුව වසා මෙම ප්‍රවේශ මාර්ගය ඉදි කරගෙන ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා**</u>

උප සභාපතිතුමා විසින් ක්‍රීඩා පිටියක් ලෙස සකස් කර දීමට යෝජනා කළ වියන්දූව මරුමුල්ලකැළේ කොටස වැනි ඉඩම් කට්ටි කළ ඉඩම්වලින් සභාව සතු වූ ඉඩම් කොටස් සෑම වසමකම පවතින බවත්, වර්තමාන ආණ්ඩුව යටතේ සිදු කිරීමට නියමිත කෘෂිකර්මය වැනි ප්‍රජාවගේ ආර්ථිකය නංවන වැඩසටහන්වලට ලොකු මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇති බවත්, එම ඉඩම් කොටස් බදු පදනම මත හෝ

වෙනත් ක්‍රමවේදයක් මත හෝ ලබා ගැනීමේ හැකියාව පවතිනවාදැයි ප්‍රජාවගෙන් ඉල්ලීමක් තිබෙන බවත් ඒ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා

මෙම කට්ටි කළ ඉඩම්වල පොදු ඉඩම් කොටස පවතිනුයේ එම කට්ටි කළ ඉඩම්වල වෙසෙන ජනතාවගේ පොදු කටයුතු සඳහා පමණක් වන බවත්, මීට ඉහත දී අභයරත්න මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවක් අනුව කුරුඳු වගා කිරීම සඳහා ඉඩමක් වෙන් කිරීමට අනුමැතිය ඉල්ලා යැවූ නමුත් එහි දී ප්‍රජාවගේ පොදු කටයුතු සඳහා වෙන් කරනු ලබන කොටස් කිසිඳු හේතුවක් මත වෙනත් කටයුත්තක් සඳහා යොදා ගත නොහැකි බවට පිළිතුරු ලැබුණු බවත්, මෙවැනි සභාව සතු ඉඩම් බොහොමයක් වල් වැදී ප්‍රයෝජනයක් නොමැතිව පවතින බවත්, ඒවා එම කට්ටි කළ ඉඩම්වල වෙසෙන ජනතාවගේ පොදු කටයුතු සඳහා පමණක් භාවිතයට ගත හැකි ලෙස පමණක් පනත ප්‍රකාරව හැකියාව පවතින බවත්, එම ඉඩම් බදු දීම කිසිසේත්ම සිදු කළ නොහැකි බවත්, එම ඉඩම්වල කඩ කාමර වැනි දෑ සාදා ඒවා බදු දීමේ හැකියාව පමණක් පවතින බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී, නිලුපුල් සම්පත් මැතිතුමා

එම කරුණු දැක්වීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත්, ඒ වගේම මීට ඉහත දී පළමු අවස්ථාවේ විරුද්ධ වුව ද දෙවන වර සභය දැක්වූ හෝටල්වලින් එකතු කරනු ලබන බදු සංශෝධනය කිරීම පිළිබඳ මේ වන විට වර්තමාන ප්‍රගතිය පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලෙස සඳහන් කරන ලදී.

ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා

ඔවුන්ගේ ඉල්ලීමකට අනුව ඔවුන් සමඟ සාකච්ඡා කොට 0.25% ක බදු මුදලකට එකඟ වූ නමුත් පෙර වර්ෂවල දැමූ නඩුවල නීතිමය කරුණක් මත මෙම වර්ෂයේ ද අපට නඩු දැමීමට සිදු වූ බවත්, නඩු දමා ඇති බැවින් එම නඩු ඉවත් කර ගන්නා තෙක් මෙම මුදල ගෙවීමට හෝටල් සංගමය අකැමති බවත්, ඒ අනුව මෙම වර්ෂය අවසන් වන තෙක් සිට ඔවුන් හා අප නීතිඥවරයා සමඟ ගිවිසුමකට හෝ එළැඹ ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී, තිලක් උපුල් වමින්ද මැතිතුමා

මාර්ගවලට දිස්වන ලෙස වෙළඳසැල්වල වහළවල් ඉහළින් ප්‍රදර්ශනය කර ඇති විවිධ ආයතනවල නාම පුවරු සඳහා මේ දිනවල බදු මුදලක් අය කරනු ලබන බවට දන්වා තිබෙන බවත්, ඒ අනුව එම වෙළඳ ආයතනවලට ඒ පිළිබඳ දැනුවත් කළ ද ඔවුන් පවසනුයේ එම බදු මුදල් ගෙවා ඇති බවටත්, එම නිසා එම බදු මුදල් සභාව වෙත ලැබී ඇතිදැයි යම් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.35 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාව

**<u>ආදායම් පරීක්ෂක, බී. එන්. ඩී. උපාලි මහතා</u>**

යම් ආයතනයක් එලෙස වෙළඳසැල්වල ඉඩමේ තම නාම පුවරු ප්‍රදර්ශනය කරන්නේ නම් ඔවුන් ප්‍රදර්ශනය කර ඇති නාම පුවරු අදාළ ස්ථාන සමඟ සඳහන් කර වාර්ෂිකව ගෙවන ලද මුදල සඳහන් කර වාර්තාවක් සභාව වෙත එවිය යුතු බවත්, මෙතෙක් එසේ වර්තා ලබා නොදුන් ආයතනවල නාම පුවරු ප්‍රදර්ශනය කර ඇති වෙළඳසැල්වලට ලිඛිත දැන්වීමක් යොමු කළ බවත් සඳහන් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී, තිලක් උපුල් චමින්ද මැතිතුමා</u>**

එම වෙළඳ ආයතන වෙත ඒ පිළිබඳ දැන් වූ විට ඒ පිළිබඳව විස්තර ඉල්ලා එම ආයතන වෙත ලිඛිත සටහනක් එවූ පසු පමණක් අදාළ තොරතුරු නිකුත් කරනු ලබන බවට පැවසූ බව සඳහන් කරන ලදී.

**<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>**

එවැනි ආයතනවල නාම පුවරු සඳහන් වෙළඳසැල්වල ලැයිස්තුවක් සකස් කොට බදු මුදල් ගෙවා අවසන් කළ යුතු නිශ්චිත දිනයක් ද සඳහන් කොට එම දිනට පෙර ගෙවා අවසන් නොකළේ නම් පුවරු ගලවා ඉවත් කරන බවට දන්වා ආයතන වෙත ලිපි යොමු කරන ලෙස සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව.11.40 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

**<u>මහ සභාව</u>**

**<u>ගරු මන්ත්‍රිනී, ලෙනිකා දූෂන්ති මැතිතුමිය</u>**

අද දින බෙන්තර ප්‍රාදේශීය සභාව ලෙස අප සියලු දෙනාටම සුවිශේෂී දිනයක් වන බවත්, මන්ද ඉතා ගැටලුකාරී තත්ත්වයක් තුළ අපි බෙන්තර ප්‍රාදේශීය සභාව පිහිටුවා මෙම ජුනි මාසයට වසරක් සපිරෙන බවත්, පක්ෂ 05 ක් එකතු වී අප මෙම සභාවේ පාලක බලය ලබා ගත් බවත්, එනමුත් විපක්ෂයේ සිටින මන්ත්‍රීතුමන්ලා සමඟ ද අද වන විට සහයෝගයෙන් සුහදව කටයුතු කරගෙන යන බවත්, සභාවේ මන්ත්‍රීවරියක් ලෙස තමන් පුද්ගලිකව ඒ පිළිබඳ සතුටු වන බවත්, මේ ගෙවුණ වසරක කාලය තුළ සභාපතිතුමා ගැන ද සඳහන් කළ යුතුම වන බවත්, ගෙවී ගිය වසරක කාලය තුළ යම් කිසි සිත් රිදවීම් සිදු වුණත් පාසලක් පාලනය කිරීමට වඩා සමස්ථ සභාවක් පාලනය කිරීම ඉතාම අපහසු බවත්, නමුත් මන්ත්‍රීවරුන් ලෙස අප ගෙන එන යෝජනා කෙසේ හෝ ඉටු කර දීමට කටයුතු සිදු කරන බවත්, පසුගිය කාලයේ වීථි ලාම්පු සම්බන්ධයෙන් විශාල ගැටලුකාරී තත්ත්වයක් පැවතුණත්, විදුලිය, මාර්ග සම්බන්ධ කටයුතු, ගම් මට්ටමින් සිදු කරනු ලබන වැඩසටහන් ආදී සියල්ල සිදු කිරීමට කටයුතු කළ බවත්, දිට්වා සුළි කුණාටු අවස්ථාවේ සභාපතිතුමා ද කාර්ය මණ්ඩලය සමඟ එකතු වී ඔවුනට ඔබතුමාගේ දැවැන්ත ශක්තිය ධෛර්යය ලබා දුන් බවත්, ඒ වගේම බෙන්තොට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස අප මන්ත්‍රීවරුන් 12 දෙනාට නිවැරදි මග පෙන්වීම, නිවැරදි කළමනාකාරීත්වය සමඟින් නිවැරදි නායකත්වය ලබා දෙමින් කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත්, මෙම අවස්ථාවේ සියලුම මන්ත්‍රීවරුන්ට වසරක් සැපිරීම වෙනුවෙන් මෙම කේක් එක කපා සැමරීමට ආරාධනා කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නිහාල් මැදගොඩ මැතිතුමා</u>

මෙවැනි සභාපතිවරයෙක් මීට පෙර බෙන්තර ප්‍රාදේශීය සභාවට පත් වී නොමැති බවත්, මීට පෙර සිටි සභාපතිවරයා මා යම් කටයුත්තකට එක් අවස්ථාවක දී සභාවට පැමිණි විට සිත් රිදවන අයුරින් කතා කළ බවත්, නව සභාපතිවරයා මෙන්ම ලේකම්තුමා ද සභාවට ඉතාමත්ම වටින බවත්, මෙම වසරක කාලය තුළ කණුවලට විදුලි බල්බ දැමීම, මාර්ග සංවර්ධනය ආදී සියල්ලක්ම ඉටු කළ බවත්, ගෙවී ගිය වසරක කාලය තුළ මන්ත්‍රීවරුන්ට සහයෝගයෙන් කටයුතු කිරිමට අවස්ථාව ලබා දීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.45 ට මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

<u>කාරක සභා අවස්ථාව</u>

- මෙම අවස්ථාවේ දී ගරු සභාපතිතුමන් ඇතුළු සියලු සභිකවරු එකතු වී කේක් කපා සභාව පිහිටුවා වසරක් ගත වීම සමරන ලදී.

- මෙම අවස්ථාවේ දී කාරක සභාව නැවත මහ සභාව බවට පත් කිරීමට ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් පෙ.ව. 11.50 ට කාරක සභාව නැවත මහ සභාව බවට පත් විය.

<u>මහ සභාව</u>

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

ගෙවී ගිය වසරක කාලය තුළ බෙන්තර ප්‍රාදේශීය සභාව යම් ඉහළ ස්ථානයකට ගෙන යාමට සියලු දෙනාගේ සිත් තුළ යම් යම් බලාපොරොත්තු තිබෙන්නට ඇති බවත්, ඔබලාගේ අදහස්වලට වඩා අදහස් ගොන්නක් මාගේ සිත තුළ ද තිබූ නමුත් ගෙවීගිය කාල සීමාවේ දී රටක් ලෙස මුහුණ දීමට සිදු වූ යම් යම් ආපදා තත්ත්වයන්, ආර්ථික දුෂ්කරතාවයන් හමුවේ එම සියල්ල ඉටු කර ගැනීමට නොහැකි වූ බවත්, එම පාලන අධිකාරියේ පහළම ස්ථානයක ප්‍රාදේශීය සභා පිහිටන බැවින් සභාවකට එහි පීඩනය දැඩි ලෙස බලපාන බවත්, උදාහරණයක් ලෙස රු. 38,000/- කට පැවති තාර බැරලය මේ වන විට රු. 70,000/- ක් පමණ වී ඇති බවත්, මේ නිසා පසුගිය කාලයේ දී සංවර්ධන කටයුතු සිදු කරනු ලැබූ මාර්ග සඳහා වැය වූ මුදල් ප්‍රමාණ යටතේ මේ වසරේ දී එතරම් සංවර්ධන කටයුතු සිදු කළ නොහැකි වන බවත්, ඒ ගැන යම් කණගාටුවක් තිබුණත් අනෙකුත් වැඩකටයුතු සම්බන්ධයෙන් උපරිම දේ සිදු කළ බවත්, පසුගිය කාලයේ විදුලි පහන් සම්බන්ධයෙන් විශාල ගැටලුකාරී තත්ත්වයක් මතු වූ බවත්, මන්ත්‍රීතුමන්ලා සමඟ ද යම් යම් ගැටීම් මේ සම්බන්ධව ඇති වූ බවත්, එම අවස්ථාවේ දී විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට ද මා පොරොන්දුවක් ලබා දුන් බවත්, මේ වන විට අකුණු අනතුරු, වර්ෂාව ආදි අවස්ථාවල දී විදුලි පහන් අක්‍රීය වීම හේතුවෙන් ලැබෙන පැමිණිලිවලට අමතරව වෙනත් පැමිණිලි අවම බවත්, බල ප්‍රදේශය තුළ සියලුම බල්බ 5400 ක් පවතින බවත්, කවුරු සභාපති වුණත් එම සියල්ලම එකවර දල්වා තැබීමට හැකියාවක් නොපවතින බවත්, මේ වන විට සභාව අනෙකුත් කාලවලට වඩා සමාජයට බද්ධ කර ඇති බවත්, විහාරස්ථාන, ස්වේච්ඡා සංවිධාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ආදිය සමඟ නිරන්තර කටයුතු සිදු කරමින් පවතින බවත්, පසුගිය කාල

සීමාවේ දී බල ප්‍රදේශයේ ස්වාමීන් වහන්සේලා තුන් නමක් අපවත් වූ අවස්ථාවේ දී කාර්ය මණ්ඩලය හා මන්ත්‍රී මණ්ඩලය සමඟ එකතු වී එම ස්වාමීන් වහන්සේලාගේ ආදාහන කටයුතු ඉහළින් සිදු කිරීමට දායක සභාවට ද වඩා වැඩි දායකත්වයක් ලබා දෙමින් ඒ හරහා ද සභාවට ගෞරවයක් අත්කර දුන් බවත්, දිට්වා සුළි කුණාටු අවස්ථාවේ දී තනි සභාවක් ලෙස සිදු කළ කාර්යය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී ස්තුති යෝජනාවක් ගෙන එන තත්ත්වයට සභාව පත් කළ බවත්, අයවැයේ දී යම් විරුද්ධත්වයක් තිබුණ ද එය දේශපාලනය වන බවත්, ඉන් පසු මා හෝ මගේ මන්ත්‍රී මණ්ඩලය විසින් ගෙන ආ කිසිදු යෝජනාවකට විරුද්ධත්වයක් පළ නොකර සහයෝගය ලබා දීම පිළිබඳ විපක්ෂ කණ්ඩායමට ස්තූතිවන්ත වන බවත්, දුෂ්කරතාවයන් බොහොමයක් මැද පැය 24 ම සේවය කරන පුද්ගලයෙකු බවට තමන් පත්ව ඇති බවත්, ඒ වගේම දෝපේ, කයිකාවල, රන්තොටුවිල කොට්ඨාස 03 ට ද අනෙකුත් කොට්ඨාසවලට මෙන්ම ප්‍රතිපාදන ලබා දීමට විරුද්ධත්වයක් නොදැක්වූ මගේ මන්ත්‍රී මණ්ඩලයට ස්තුතිවන්ත වන බවත්, ඉදිරි අවුරුදු තුනේ දී ද මෙලෙසම කිසිදු භේදයකින් තොරව සෑම කොට්ඨාසයකටම සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන බවත්, ඉදිරියේ දී ද සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලැබෙතැයි අපේක්ෂා කරන බවත්, සියලු දෙනාටම ස්තුතිවන්ත වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති, ප්‍රසන්න ගුණවර්ධන මැතිතුමා</u>

මෙතෙක් අපට දැනෙන ඡන්දයක් තිබුණේ ගිය වසරේ ජුනි 24 වන දින සභාපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා පැවති ඡන්ද විමසීම පමණක් බවත්, සභාපතිතුමා සඳහන් කළ ආකාරයට ප්‍රතිපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ද අපට කටයුතු කරගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් බවත්, මැදගොඩ මන්ත්‍රීතුමා සඳහන් කළා සේ බෙන්තර ප්‍රාදේශීය සභාවට මෙවන් සභාපතිවරයෙක් මෙතෙක් පත් වී නොමැති බවත්, මේ වන විට සභාව පිළිබඳ ජනතාව තුළ ප්‍රසාදයක් ඇති වී තිබෙන බවත්, මන්ත්‍රීවරුන් සියලු දෙනා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය වෙත ඒ පිළිබඳ ස්තුතිවන්ත වන බවත්, පසුගිය දින පැවති මාර්ග ආරක්ෂණ කමිටුවේදී අප සභාව වෙත ඉටු කිරීමට තිබූ සියලුම යෝජනා ඉටු කර අවසන් කර තිබූ බවත්, ගාලු දිස්ත්‍රික්කයේ එසේ සියලු යෝජනා ඉටු කර තිබූ එකම සභාව අප සභාව වන බවත්, සම්බන්ධීකරණ කමිටුවේ දී ඉදිරිපත් කරනු ලබන යෝජනා වුවත් අප සභාව විසින් ඉටු කරනු ලබන බවත්, අනෙකුත් සභාවල එවන් තත්ත්වයක් නොමැති බවත්, සභාපතිතුමාගේ හැකියාව හා දක්ෂතාවය මත මෙන්ම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මත මෙලෙස කටයුතු කිරීමේ හැකියාව උදාවී තිබෙන බවත්, මේ වන විට සභා වාර 12 ක් අවසන් වී ඇති බවත්, ඉදිරියේ දී තවත් සභා වාර 36 ක් පැවැත්වීමට නියමිත බවත්, එම සභා වාරවල දී මීටත් වඩා සහයෝගයෙන් එකමුතුබවෙන් වැඩ කොට බෙන්තර ජනතාවට දැනෙන්න යමක් සිදු කිරීමට කටයුතු කරන මෙන් සමස්ථ සභාවෙන්ම ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

- මෙම අවස්ථාවේ දී ප.ව. 12.00 ට ගරු මන්ත්‍රී එම්. ඩී. නිලුපුල් සම්පත් මැතිතුමා ගරු සභාවෙන් පිටව යන ලදි.

<u>ගරු මන්ත්‍රී, ප්‍රදීප කොඩිතුවක්කු මැතිතුමා</u>

බෙන්තොට ප්‍රාදේශීය සභාව පිහිටුවා වසරක් සපිරෙන මෙම මොහොතේ ඉටු කරන ලද කාර්යභාරය පිළිබඳ ස්තුතිවන්ත වන බවත්, නිසියාකාරව සභාව පවත්වාගෙන යාම සඳහා සහයෝගය ලබා දුන් හිටපු ලේකම්තුමියට මෙන්ම වර්තමාන ලේකම්වරයාට හා කාර්ය මණ්ඩලයට ද සුභ පැතුම් එක් කරන බවත්, සභාපතිතුමා ඇතුළු අප සියලු දෙනාටම තම තමන්ගේ දේශපාලනයක් තිබෙන බවත්, එම දේශපාලනය තුළ කටයුතු කරගෙන යන බවත්, තම පක්ෂය විසින් සෑම අවස්ථාවක දීම ගැටුමක් ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට උත්සහ කළ බවත්, අයවැය හැර අනෙකුත් කිසිම යෝජනාවක දී බෙදීමක් නොඉල්ලූ

බවත්, බෙන්තර ප්‍රාදේශීය සභාව හරහා බෙන්තර ජනතාවට සේවයක් කිරීමට පමණක් උත්සාහ කළ බවත්, මා සමඟ 11 දෙනෙකුගෙන් යුතු කණ්ඩායම මේ වෙනුවෙන් නියැලෙන බවත්, එක් අයෙකුගෙන් පමණක් වෙනස් වන සංයුතියක් තිබෙන කණ්ඩායම් දෙකක් ලෙස පැවතියත් මෙම වර්ෂය තුළ දී ඔබේ කණ්ඩායමෙන් අයෙකු ගලවා ගැනීමට හෝ ඔබේ කටයුතුවලට විරුද්ධ වීමට කටයුතු නොකළ බවත්, අපේ කාර්යභාරය යම් සාධනීය මට්ටමකින් ඉෂ්ට කළ බවට විශ්වාස කරන බවත්, ඔබතුමා ඇතුළු කණ්ඩායම ඉදිරියේ දීත් සිදු කරනු ලබන සාධනීය වැඩ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන බවත්, යම් ක්‍රියාවලියකින් බෙන්තර ජනතාවට අගතියක් සිදු වනවා නම් කොහෙත්ම ඒ සඳහා සහයෝගය ලබා නොදෙන බවත්, එවැනි දේ සඳහා අපේ මැදිහත් වීම සිදු කර අපගේ අදහස් පළ කරන බවත්, සභාපතුතිමා ඇතුළු සියලු දෙනාට නැවතත් සුභාශිංසන එක් කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ඉන්දික දිනේෂ් සේරසිංහ මැතිතුමා</u>

මා නිතර ගමන් කරනු ලබන බෝගහ හංදිය පාරේ නිවසක ජීවත් වන සිසිර නැමති මහත්මයෙක් සෑම දිනකම  එම පාරේ දමා යන ටොපි කොළ, කඩදාසි කොළ ආදිය මාර්ගය දිගේම ගොස් එකතු කොට ඒවා සභාවේ කුණු එකතු කරන රථයට ලබා දෙන බව දුටු බවත්, ඒ වගේම ඊයේ දිනද දිල්රුක්ෂි නම් එක්තරා මහත්මියක් පාරේ තමන්ගේ කොටස මෙන්ම අනෙක් කොටස ද පිරිසිදු කරන බව දුටු බවත්, මෙවැනි නිහඬ සේවයක් ඉටු කරනු ලබන පුද්ගලයින් සෑම මන්ත්‍රීවරයෙකුගේම කොට්ඨාසයේ සිටිය හැකි බවත්, මෙවැනි අය සඳහා කුඩා තිළිණයක් ලබා දී යම් ඇගයීමක් සිදු කළ යුතු බවත්, අනෙක් අයට ද මෙය ආදර්ශයක් වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා</u>

එය බොහොම හොඳ යෝජනාවක් බවත්, යාලගම ප්‍රදේශයේ ද උපාලි නැමති පුද්ගලයෙකු වේල්ල දක්වාම පිරිසිදු කරන අයුරු නිතර දකින බවත්, එම පුද්ගලයාගේ පාදය ද බැන්ඩේජයකින් ඔතා තිබෙන අයුරු දැක ඇති බවත්, එවැනි අපහසුතා මැද මෙවැනි සේවයක් ඉටු කරන පුද්ගලයින් ඇගයීම ඉතාමත් වටිනා බවත්, ඉදිරියේ දී එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෙදෙන්නේ නම් මෙම පුද්ගලයින් අනිවාර්යෙන් ඒ සඳහා යොදා ගන්නා ලෙසත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, තාරක විජේකෝන් මැතිතුමා</u>

ගෙවී ගිය කාලය වෙනුවෙන් සතුට ප්‍රකාශ කරන අතර ඉදිරි කාලය සඳහා සුභ පතන බවත්, අපට සතුටු විය හැකි ආකාරයට සභාවේ ඉදිරි කටයුතු සිදු වේවායි බලාපොරොත්තුවක් සමඟ මේ වෙලාව වෙන් කර ගනු ලැබුවේ ඉදිරි කාලය පිළිබඳ සභාපතිතුමාට යම් කාරණා කීපයක් මතක් කර දීමට බවත්, සභාව ආරම්භයේ දී අප සිටියේ සතුටු විය හැකි මට්ට්මක නොවන බවත්, කුඩාරම් වල සිටින ලෙස සභාපතිතුමා එක් තැනක සභාව වෙනත් තැනක ආදී ලෙස ඉතා කටුක ලෙස බවත්, පළමුව සභාව එක තැනකට ගෙන ඒම පිළිබඳ ස්තුතිවන්ත වන බවත්, කුණු එකතු කිරීමේ කටයුතු සඳහා අලුතින් ට්‍රැක්ටර් දෙකක් මේ වන විට සකස් කර තිබෙන බවත්, ඒ වැඩපිළිවෙළ හොඳින් කරගෙන යන බවත්, ඒ ලෙසම සභාවේ අනෙක් වාහන පිළිබඳ ද අවධානය යොමු කොට නඩත්තු කටයුතු සිදු කරන ලෙසත්, වාහන පිටින් ලබා ගැනීමට වඩා සභාවේ වාහන යොදා ගැනීම ලාභදායී බවත්, ඒ වගේම සභාපතිතුමා ඇත්තනේම අති දක්ෂයෙක් බවත්, අපේ වාසනාවකට අපට හොඳ ලේකම්වරයෙක් ලැබුණ බවත්, ඒ පිළිබඳ සඳහන් කිරීමට හේතුව ගල් රෝලක් ගැනීමට අවශ්‍ය බව පැවසූ විට හොඳ තත්ත්වයේ ගල් රෝලක් සහා අරමුදලින් ගත යුතු බව පවසා වෙනත් සභාවකින් හුවමාරු කර ගැනීමට හැකියාවක් තිබේ නම් එය වඩා සුදුසු බවත් පවසා ඒ පිළිබඳ සොයා බලා මේ වන විට ඉතාම හොඳ තත්ත්වයේ පවතින ගල් රෝල් තුනක් පිළිබඳ දැනුම් දුන් බවත්, ඉදිරියේ දී ඒවා පරීක්ෂා කිරීමට

යාමට බලාපොරොත්තු වන බවත්, ගල් රෝලක් අප සභාවට ඉතාම අත්‍යවශ්‍ය වන බවත්, ඒ මඟින් මාර්ග සංවර්ධනයේ දී ප්‍රිමික්ස් යොදා ඇතිරීමේ දී වැයවන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමේ හැකියාව පවතින බවත්, ඉදිරියේ දී ලොකු නියඟයක් ඇති වන බව කාලගුණයෙන් දන්වා ඇති බවත්, පසුගිය කාලයේ දී ඇති වූ පොඩි නියඟයට අපි සභාවක් ලෙස මුහුණ දුන් ආකාරය පිළිබඳ සිතා බලා ජනතාවගේ ජල අවශ්‍යතාවය ලබා දීමට හැකි වැඩපිළිවෙළක් සකස් කර ගැනීම සුදුසු බවත්, ඒ වගේම අපගේ වාහන අංගනයට සර්විස් එකකට අවශ්‍ය වන බඩු මේ වන විට ලබා ගෙන ඇති බවත්, ඒවා කඩිනමින් සවි කොට වාහන නඩත්තුවට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, හෝටල්වලින් එකතු කරනු ලබන බදු සම්බන්ධව අදහස් දැක්වීමේ දී අපේ පනත මේ සම්බන්ධයෙන් පණ මදි තත්ත්වයක් පැවති බවත්, මේ නිසා පාර්ලිමේන්තුවට මෙම ගැටලුව රැගෙන ගොස් කතිකාවතක් ඇති කිරීමට කටයුතු කරන ලෙස කොඩිතුවක්කු මන්ත්‍රීතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන බවත්, මෙය අප සභාවට පමණක් බලපාන ගැටලුවක් නොවන බවත්, සියලුම පළාත් පාලන ආයතනවලට ඇතිවන ගැටලුවක් වන බවත්, එවිට අපට නඩු දැමීමට වාද විවාද සිදු කිරීමට අවශ්‍ය නොවන බවත්, බදු මුදල් එකතු කර ගැනීමට නිසි ක්‍රමවේදයක් සකස් වන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, මිගාර වලල්ලාවිට මැතිතුමා</u>

අද ඉතාම සංතෝෂ දිනයක් වන බවත්, දීර්ඝ කාලයක් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කළ බවත් මෙලෙස කේක් කපා මෙවැනි අවස්ථාවක් සැමරූ පළමු අවස්ථාව මෙය වන බවත්, ඒ පිළිබඳ සතුටු වන බවත්, මෙම අවස්ථාව සංවිධානය කළ සියලු දෙනාට ඒ සඳහා ස්තූතිය පුද කරන බවත්, පක්ෂ 05 ක එකතුවකින් සිටින අප කණ්ඩායමේ මගේ පක්ෂය නියෝජනය කරනු ලබන මමත්, තිලක් මන්ත්‍රීතුමත්, සභාපතිතුමාට සහයෝගය ලබා දීමට එක් වූ බවත්, මා වෙනුවට සභාව නියෝජනය කිරීමට වෙනත් අයකු පැමිණීමට සිටියත් ඔහු ප්‍රේමකුමාර මන්ත්‍රීතුමාට සභාපතිවරයා වීමට ඡන්දය ලබා නොදෙන බවට ප්‍රසිද්ධියේ සඳහන් කර තිබූ බවත්, නමුත් මා සභාවට පත් වුණොත් මගේ සහයෝගය ලබා දෙන බව පැවසූ බවත්, මෙම සභාපතිවරයා කාලයක්ම සභාව නියෝජනය කළ කිව්වොත් කියන දේ කරන ඉතාමත් දක්ෂ මන්ත්‍රීවරයෙක් බවත්, ආණ්ඩු පක්ෂයේ සිටියත් වැරැද්දක් සිදු වනවා නම් එය නොබියව පෙන්වා දුන් බවත්, අනෙකුත් සභාවල මෙවැනි විකල්ප කණ්ඩායමක් සිටින විට දී පක්ෂ අතර ගැටුම් ඇතිවන බවත්, සමහරුන් ඉවත්ව යන බවත්, නමුත් අප සභාවේ සියලු දෙනාම එකතු කරගෙන ඔබතුමා කරගෙන යන වැඩපිළිවෙළට මාත්, තිලක් මන්ත්‍රීතුමත්, සෞම්‍ය මන්ත්‍රීතුමත් අපගේ සුභාශිංසන පළ කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, නදීෂාන් වික්‍රමරත්න මැතිතුමා</u>

මීට වසරකට පෙර මේ සභාව රැස්වන අවසථාවේ දී අප කණ්ඩායමේ සාමාජිකයන් පවා එතරම් සුහදව නොහඳුනන මට්ටමක පැවති බවත්, මේ වන විට අප 23 දෙනාම හොඳින් හඳුනන සමීපව ඇසුරු කරන එකම ගමනක් යන කණ්ඩායමක් ලෙස සිතෙන බවත්, ඒ සඳහා සභාපතිතුමා මූලිකත්වයගෙන කටයුතු කරන බවත්, එක් එක් අයගේ දක්ෂතා වෙන වෙනම හඳුනාගෙන ඒ අනුව වැඩ කටයුතු පවරා සිදු කර ගැනීමට එතුමන් දක්ෂ වන බවත්, මෙම සභාවේ විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරන මන්ත්‍රීවරුන් සිටින බවත් ඒ සියල්ලන්ගෙන්ම වැඩ ගැනීමට සභාපතිතුමා දක්ෂ බවත්, මින් පෙර ස්වෙච්ඡා සංවිධාන හා එකතු වී සිදු කළ විවිධ කටයුතුවලදී පෙර හිටපු සභාපතිවරුන් අප දරන පක්ෂය හේතුවෙන් වතුර එකක් පවා නොදුන් බවත්, එවැනි තත්ත්වයක් තිබූ සභාවක් අද වන විට අප පෞද්ගලිකව කතා කළ යුතු නොවන බවත්, පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මෙන්ම බෙන්තර නොවුණත් කුළි පදනම මත සිටියත් සභාපතිතුමා වතුර එක යවන බවත්, දේශපාලනීකරණය නොවුණ බෙන්තරට සේවයක් කරන සභාවක් බවට බෙන්තර ප්‍රාදේශීය සභාව පත්වී තිබීම සම්බන්ධව සතුටු වන බවත්, පක්ෂ පාට භේද තිබුණත් අවශ්‍ය

අවස්ථාවලදී අවශ්‍ය සේවය සභාපතිතුමා ලබා දෙන බවත්, අප කණ්ඩායමේ මන්ත්‍රීවරුන් නොමැති කොට්ඨාස 03 සඳහා ද සභාපතිතුමා ප්‍රතිපාදන වෙන් කර තිබෙන බවත්, ඉදිරියේ දී අපේ කොට්ඨාස දියුණු කර ගැනීම සඳහා මධ්‍යම රජයේ ප්‍රතිපාදන ද ලැබෙතැයි අපේක්ෂා කරන බවත්, පෙර දී ගමේ සමිතිවලින් සංවර්ධන යෝජනා ලබා ගන්නවා නම් පොදුවේ සියලු දෙනාට ඒ සඳහා සහභාගී වීමේ හැකියාව පැවති බවත්, නමුත් වර්තමානයේ එවැනි කමිටුවලින් ඉදිරිපත් කර ඇති යෝජනා පිළිබඳ කිසිදු දැනුවත්භාවයක් නොමැති බවත්, ඒ සම්බන්ධව සභාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින බවත්, මේ පිළිබඳ සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමාව ද දැනුවත් කරන මෙන් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී, ලියනගමගේ අභයරත්න මැතිතුමා</u>

"ධම්මෝ හවේ රක්ඛතී ධම්ම චාරී" ධර්මයේ හැසිරෙන කෙනා, ධර්මය දකින කෙනා, ධර්මයේ මඟ යන කෙනා ධර්මය විසින්ම ආරක්ෂා කරන බව විශ්ව සනාථ ධර්මය වන බවත්, අපේ සභාපතිතුමා ද ධර්මයේ හැසිරෙමින් මෙම වැඩකටයුතු සිදු කළ නිසා එතුමන්ව ද ධර්මය විසින් ආරක්ෂා කරන බවත්, ඒ නිසා විශ්වයේ ආශිර්වාදය නිතැතින්ම එතුමාට ලැබී ඇති බවත්, පක්ෂ රාශියක අදහස් හා විපක්ෂයේ අදහස් එකට කැටි කොට වැඩ කටයුතු සිදු කිරීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවන බවත්, මෙවැනි කණ්ඩායමක් හසුරවමින් පාලනය කිරීම සැබෑම නායකයෙකු තුළ ඇති ලක්ෂණයක් බවත්, මෙම අවස්ථාවේ දී සභාපතිතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුභාශිංසන පුද කරන බවත් සඳහන් කරන ලදී.

**8.3.** <u>**ගරු මන්ත්‍රීතුමන්ලා/ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම :-**</u>

ගරු සභාපති ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා විසින් අද දින සභාවට නොපැමිණි ගරු මන්ත්‍රී මද්දුමාතොටගේ නිශාන්ත කුමාර මැතිතුමාගේ නිවාඩු ඉල්ලීම් ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී සමිත පුංචිහේවා මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ප්‍රනාන්දු මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති, ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා:-**</u>

මෙතෙක් වෙලා සභාවේ රැඳී සිටිමින් සහයෝගය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 20 දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් ගරු සභාපතිතුමා විසින් සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

ප.ව. 12.30 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.

.............................

ප්‍රේමකුමාර විජේවර්ධන මැතිතුමා,

සභාපති,

බෙන්තොට ප්‍රාදේශීය සභාව.